# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,920 — 1970 අගෝස්තු 21 වැනි සිකුරාද — 1970.8.21

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — | ආණ්ඩුවේ නිවේදන ... ... ... | 620 |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... ... | 615 | මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | 616 | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරණ පත් කිරීම් ආදිය ... | 617 | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 619 | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... .. | 622 |
| | | "සුරාබද්ද ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


සැලකිය යුතුයි.—මෙවර ප්‍රසිද්ධ කරණු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයන්ගේ සහ උපදේශක වරුන්ගේ නාම ලේඛනයක් පළවේ.

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

**1970 අංක 238**

අංකය : ඩී. 201/ඩීඅයිඑස් සී.

**යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්**

පහත නම සඳහන් නිලධාරියා 1970 අගෝස්තු මස 10 දින සිට තාවකාලික කර්නල් වශයෙන්—

ලුතිනන් කර්නල් ඩොනල්ඩ් ඩැනිස්ටර් හේවාගම, ල. යු. පොදු. සේ. බ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩ බලන ස්ථිර ලේකම්.

1970 අගෝස්තු මස 8 දින,
කොළඹදී ය.

8-647

**1970 අංක 239**

අංකය : ඩී. 21/ආර්ජීසීපී/461.

**යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්**

පහත නම් සඳහන් නිලධාරියා 1970 නොවැම්බර් මස 16 වැනි දින සිට යුද්ධ හමුදා ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත.

මේජර් කිරුපානන්දන් රාජනාදන්, ල. ඉ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩ බලන ස්ථිර ලේකම්.

1970 අගෝස්තු මස 8 දින,
කොළඹදී ය.

8-646

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

**1970 අංක 240**

අංකය : ඩී. 250/ආර්සීටී/3(III)

## යුද්ධ හමුදව—ස්ථිර බල හමුදව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම් ඉදිරියේ සඳහන් කර ඇති දිනයන්හි සිට මේජර් වරුන් වශයෙන්:—

කපිතන් (තාවකාලික මේජර්) දුලිප්සිං උපවංස වීරසිංහ, ල. කා. හ.—1968 ජනවාරි 28 වෙනි දින.
කපිතන් (තාවකාලික මේජර්) ප්‍රසන්න ගුනසීලු සේපාල පණ්ඩිත දහනායක, ල. සි. රෙ.—1968 පෙබරවාරි 8 වැනි දින.
කපිතන් (තාවකාලික මේජර්) මාපිටියගේ සරත්චන්ද්‍ර විජේසිංහ, ල. ඉ.—1969 ජුනි 1 වැනිදින.
කපිතන් (තාවකාලික මේජර්) නොලැස්කෝ එවරිස්ටස් රන්ස්පඩ් මාටින්, ල. ඉ.—1968 ඔක්තෝබර් 21 වැනි දින.
කපිතන් (තාවකාලික මේජර්) වීරවරණ ජයසූරිය තොටගේ කුමාරපාල ප්‍රනාන්දු, ල. ස. බ.—1968 ඔක්තෝබර් 21 වැනි දින
කපිතන් (තාවකාලික මේජර්) හර්බට් ජෙරාඩ් පීරිස් විජේසිංහ, ල. ඉ.—1968 නොවැම්බර් 11 වැනි දින.
කපිතන් (තාවකාලික මේජර්) හෙට්ටිආරච්චි ග්‍රෙෂන් හැරී ගුණවර්ධන, ල. ඉ.—1968 නොවැම්බර් 18 වැනි දින.
කපිතන් (තාවකාලික මේජර්) දෙන් විල්මට් හපුආරච්චි, ල. සි. රෙ.—1969 ජනවාරි 2 වැනි දින
කපිතන් (තාවකාලික මේජර්) ලියනගේ ගුනසෝම සිගේරා, ල. යු. යු. බ—1969 ජනවාරි 2 වැනි දින
කපිතන් (තාවකාලික මේජර්) මහාදේවන් කන්දයියා, ල. සි. රෙ.—1969 ජනවාරි 2 වැනි දින.
කපිතන් (තාවකාලික මේජර්) ජයන්ත අයිවන් ද සිල්වා ජයරත්න, ල. කා. හ.—1969 ජනවාරි 26 වැනි දින
කපිතන් (තාවකාලික මේජර්) අභය හුලන්ගමුව, ල. පා. හ.—1969 ජනවාරි 26 වැනි දින
කපිතන් (තාවකාලික මේජර්) මරක්කලගේ විජිත කුරුකුලසූරිය, ල. යු. පොදු. සේ. බ—1969 මාර්තු 17 වැනි දින
කපිතන් (තාවකාලික මේජර්) ලොකුලියනගේ ක්ලෙමන්ට් ජෝන් කබ්රාල්, ල. ඉ.—1969 අප්‍රේල් 1 වැනි දින
කපිතන් (තාවකාලික මේජර්) සෝමසිරි වික්‍රමසිංහ, ල. ඉ.—1969 අගෝස්තු 1 වැනි දින
කපිතන් (තාවකාලික මේජර්) චාමර්ස් හිල්ටන් ප්‍රනාන්දු, ල. ස. ස. බ.—1969 අගෝස්තු 8 වැනි දින.

උතුමාණන්වහන්සේ ගේ අණපරිදි,

ඒ. ආර්. රත්නවෙල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ වැඩ බලන ස්ථිර ලේකම්.

1970 අගෝස්තු මස 8 වන දින
කොළඹදීය.

8–645

---

**1970 අංක 241**

අංකය : ඩී.250/ආර්ජීසීපී/1

## යුද්ධ හමුදව—ස්ථිර බල හමුදව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් 1970 අප්‍රේල් මස 1 වැනි දින සිට ලුතිනන් වරුන් වශයෙන් :—

දෙවැනි ලුතිනන් මිල්රෝයි ටෙරන්ස් සෙනවිරත්න, ල. ස. බ.

දෙවැනි ලුතිනන් කස්තුරි ආරච්චිගේ ඥාණවීර, ල. ස. බ.

දෙවැනි ලුතිනන් ඇල්ප්‍රඩ් අර්නස්ට් තෝමස් පෙරේරා, ල. ස. බ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ වැඩ බලන ස්ථිර ලේකම්.

1970 අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දීය.

8-659

**1970 අංක 242**

අංකය : ඩී/වීඑප්/18/ඒ(IV)

## රාජකීය ලංකා නාවික හමුදාව—ස්වේච්ඡා නාවික බලකාය අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පිළිගන්නා ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

පහත නම සඳහන් නිලධාරියා 1970 අගෝස්තු මස 15 වැනි දින සිට රාජකීය ලංකා නාවික හමුදාවේ ස්වේච්ඡා නාවික බලකායේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පිළිගෙන ඇත.

උප ලුතිනන් ආර්. එන්. ආසිර්වාදම්, රාජකීය ලංකා ස්වෙච්ඡා නාවික බලකාය.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ වැඩ බලන ස්ථිර ලේකම්.

1970 අගෝස්තු මස 6 වෙනි දින,
කොළඹ දීය.

8-660

---

# රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

**1970 අංක 243**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පහත සඳහන් පත්වීම් නියෝග කර ඇත.

ඒ. 41/47.

1970 අගෝස්තු මස 1 වැනි දින සිට ලංකා පරිපාලන සේවයේ එස්. පී. නානායක්කාර මහතා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වශයෙන්.

ඒ. 7/70.

ලංකා පරිපාලන සේවයේ පී. ඒ. ටී. ගුණසිංහ මහතා, 1970 ජූනි මස 27 වැනි දින සිට අලෙවි කිරීමේ කොමසාරිස් ලෙස වැඩ බැලීමට.

ඒ. 34/68.

ලංකා පරිපාලන සේවයේ එල්. ඒ. උඩුවෙල මහතා 1970 මැයි මස 9 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු මහනුවර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන් වැඩ බැලීමට.

ඒ. 2/68.

1 වැනි ශ්‍රේණියේ සමුපකාර සමිති පරීක්ෂක, ඩී. කේ. සමරවීර මහතා, 1970 අප්‍රේල් මස 7 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු මුළු දිවයින සඳහාම සහකාර ආහාර පාලකවරයකු සහ සහකාර මිල (ආහාර) පාලක වරයකු වශයෙන් වැඩ බැලීමට.

ඒ. 2/70.

සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පන්තියේ 1 වැනි ශ්‍රේණියේ මාර්කණ්ඩු සුප්පිරමනියම් මහතා 1970 පෙබරවාරි මස 22 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, මඩකලපුව පාලන දිස්ත්‍රික්කයේ දකුණු මන්මුනෙයි සහ එරුවිල් පෝරතිවු කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි ලෙස වැඩ බැලීමට.

ඒ. 2/70.

සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පන්තියේ 1 වැනි ශ්‍රේණියේ මුත්තතම්බි මුරුගපිල්ලේ අරුලානන්දම් මහතා 1970 පෙබරවාරි මස 20 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, මඩකලපුව පාලන දිස්ත්‍රික්කයේ බටහිර මන්මුනේ පත්තු කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි ලෙස වැඩ බැලීමට.

ඒ. 2/70.

සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පන්තියේ I වැනි ශ්‍රේණියේ ජී. එම්. පතිරත්න මහතා 1970 මාර්තු මස 1 වන දින සිට නැවත නියමයක් කරනතුරු නුවරඑළිය පාලන දිස්ත්‍රික්කයේ කොත්මලේ කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි ලෙස වැඩ බැලීමට.

ඒ. 22/69.

පළමුවැනි ශ්‍රේණියේ සමූපකාර සමිති පරීක්ෂක ජේ. ආර්. ද ඇල්. කරුණාරත්න මහතා 1970 පෙබරවාරි 15 වැනි දින සිට සමූපකාර සංවර්ධන උප කොමසාරිස්වරයකු වශයෙන් වැඩ බැලීමට.

ඒ. 2/70.

සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පන්තියේ I වැනි ශ්‍රේණියේ ඊ. සභාරත්නම් මහතා 1970 පෙබරවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු වවුනියා පාලන දිස්ත්‍රික්කයේ වෙන්ගලචෙඩ්ඩිකුලම් කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි ලෙස වැඩ බැලීමට.

ඒ. 2/70.

සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පන්තියේ I වැනි ශ්‍රේණියේ යූ. ඒ. බී. ඇල්කඩුව මහතා 1970 මාර්තු මස 5 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු කුරුණෑගල පාලන දිස්ත්‍රික්කයේ දඹදෙනි හත්පත්තු කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි ලෙස වැඩ බැලීමට.

ඒ. 2/70.

සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පන්තියේ I වැනි ශ්‍රෙණියේ එච්. ඩබ්ලිව්. පී. ද සිල්වා මහතා 1970 පෙබරවාරි මස 18 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු අම්පාර පාලන දිස්ත්‍රික්කයේ කරවාහු පත්තු කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි ලෙස වැඩ බැලීමට.

ඒ. 2/70.

සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පන්තියේ විශේෂ ශ්‍රේණියේ එස්. කන්කේසන් මහතා 1970 මාර්තු මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ත්‍රිකුණාමලය පාලන දිස්ත්‍රික්කයේ මූතූර් කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි ලෙස වැඩ බැලීමට.

ඒ. 2/68.

සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකාර පංතියේ විශෙෂ ශ්‍රේණියේ ලිපිකරු එස්. වේලයුදම්පිල්ලේ මහතා 1970 පෙබරවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, මුළු දිවයින සඳහාම, සහකාර ආහාර පාලකවරයකු සහ සහකාර මිල (ආහාර) පාලකවරයකු වශයෙන් වැඩ බැලීමට.

ඒ. 2/68.

සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකාර පංතියේ විශෙෂ ශ්‍රේණියේ ලිපිකරු ජී. ඊ. පෝබ්ස් මහතා 1970 පෙබරවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, මුළු දිවයින සඳහාම, සහකාර ආහාර පාලකවරයකු සහ සහකාර මිල (ආහාර) පාලකවරයකු වශයෙන් බැඩ බැලීමට.

ඒ. 2/70.

වවුනියා පාලන දිස්ත්‍රික්කයේ වවුනියා දකුණු දෙමළ කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි, ලංකා පරිපාලන සේවයේ කේ. මහාදේව මහතා ස්වකීය රාජකාරිවලට අතිරේකව 1969 අගෝස්තු මස 29 වැනි දින සිට 1970 ජනවාරි මස 31 වැනි දින දක්වා වෙන්ගල චෙඩ්ඩිකුලම් ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි වශයෙන් වැඩ බැලීමට.

එස්. පී. නානායක්කාර,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. 500,
කොළඹ 1. 1970 අගෝස්තු මස 13 වැනි දින.

8-735

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

**1970 අංක 244**

අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ ය :—

අංකය : ජේඒ. 26/48.

සී. බී. වල්ගම්පාය මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් අගෝස්තු මස 4 වැනි දින සිට කළුතර දිස්ත්‍රික් උසාවියේ අංක පී. 2,904 දරණ නඩුවේ තීන්දුව දීම පිණිස කළුතර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑම්. ජී/40/66.

බී. ආර්. සිල්වා මහතා 1970 අගෝස්තු මස 3 වන දින සිට නැවත නියෝගයක් කරන තෙක් අතිරික්ත නිලධාරියෙකු වශයෙන් සහ අවිස්සාවේල්ල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑම්./ජී. 40/66.

ඒ. එච්. ඊ. මොලමූරේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එම්. එස්. එස්. කොරයා මහතා 1970 අගෝස්තු මස 6 වන දින සිට පොලොන්නරුවේ ක්‍රියා කරන අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑම්./ජී. 40/66.

එම්. පී. විජේසිංහ මහතා 1970 අගෝස්තු මස 6 වන දින සිට නැවත නියෝගයක් කරන තෙක් හෝ අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන, මන්නාරම සහ වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, වවුනියාවේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්. 12/66.

එන්. බී. ඩී. එස්. විජේසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එන්. ජේ. වී. කුරේ මහතා 1970 ජූලි මස 21 දින කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්. 12/66.

එන්. බී. ඩී. එස්. විජේසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එච්. ඊ. විජේතුංග මහතා 1970 ජූලි මස 22 දින කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඞී. 19/57.

කේ. සී. ඊ. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එස්. සූරවීර මහතා 1970 ජූලි මස 28 සහ 29 දිනයන්හි කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට්, කොමසාරිස් තැන, සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඒ. 11/65.

ජේ. ජී. ආසිර්වාදම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු පී. ජී. ද සිල්වා මහතා 1970 ජූලි මස 31 දින සිට අගෝස්තු මස 3 දින දක්වා අවිස්සාවේල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 29/63.

එම්. ෂන්මුගලිංගම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එෆ්ජ. වී. එච්. ලාබ්‍රෝයි මහතා 1970 අගෝස්තු මස 5 වැනි දින සිට 7 දින දක්වා නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ හැටන්හි ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : පීඑල්/එස්. 7/49.

කේ. සින්නතම්බි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු පී. වී. සේනාධිරාජා මහතා 1970 අගෝස්තු මස 10 වැනි දින සහ 11 වැනි දිනයන්හි වවුනියා සහ මන්නාරම් දිස්ත්‍රික්කයන්හි වව්නියා දකුණ ගම්බද උසාවි සභාපති සහ මාන්තෙයි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ජී. 2/50.

ඩබ්ලිව්. ගුණවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඩබ්ලිව්. එල්. මාලවන මහතා රත්නපුර දිස්ත්‍රික්කයේ කඩවත මැද සහ නවදුන් කෝරලේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඒ/8/57.

ජේ. ඊ. ඉලංගන්තිලක මහතා 1970 අගෝස්තු මස 24 වැනි දින සිට වලල ගම්බද උසාවියේ අංක ග/උ/6194 දරණ අපරාධ නඩුව ඇසීමට සහ අසා නිමකර තීන්දුව දීම පිණිස මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර සහ උඩු දුම්බර අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන්.

අංකය : පීඑල්/පී. 7/57.

ඇම්. ඇම්. පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු ජී. සූරියආරච්චි මහතා 1970 අගෝස්තු මස 7 වැනි දින සහ 8 වැනි දිනයන්හි කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව නිකවැරටිය ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන්හි ගම්බද උසාවි සභාපති සහ හිරියාල හත්පත්තුවේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එම්. 57/56.

සී. බී. හුණුකුඹුර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඉන්ද්‍රානි එම්. එස්. ගොඩකුඹුර මෙනෙවිය 1970 අගෝස්තු මස 14 සහ 17 වැනි දිනයන්හි රත්නපුර දිස්ත්‍රික්කයේ අට කලන් සහ කොලොන්නා කෝරලේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එච්. 5/56.

සී. බී. හුණුකුඹුර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඇම්. ජී. දිසානායක මහත්මිය 1970 අගෝස්තු මස 18 වැනි දින රත්නපුර දිස්ත්‍රික්කයේ අටකලන් සහ කොලොන්නා කෝරලේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඒ/12/57.

එස්. ඒ. යටවර මහතා 1970 අගෝස්තු මස 25 වැනි දින සිට වාරියපොල ගම්බද උසාවියේ අංක වා/අප/1598 දරණ නඩුව ඇසීමට සහ අසා නිම කර තීන්දුව දීම පිණිස මහනුවර දිස්ත්‍රික්කයේ මාතලේ දකුණ-නැගෙනහිර අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන්.

සිරිමෙවන් අමරසිංහ,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

1970 අගෝස්තු මස 11 ද,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී.

8-666/1

---

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන ලද අවලංගු කිරීම්

අංකය : පීඑල්/ඩී. 11/63.

1970 ජූලි මස 26 වැනි දින ජී. එච්. ජී. එෆ්. එන්. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තොට වලල්ලාවිටි කෝරලේ සහ වැල්ලබඩ පත්තු ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට සමාංක හා 70. 7. 3 වැනි දින දරණ ලිපියෙන් නීතිඥ ඩබ්ලිව්. ඕ. ඒ. ද සිල්වා මහතා වෙත දී ඇති පත්වීම මෙයින් අවලංගු කරනු ලැබේ.

සිරිමෙවන් අමරසිංහ,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

1970 අගෝස්තු මස 11 ද,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී.

8-666/2

## වෙනත් පත්කිරීම් ආදිය

**1970 අංක 245**

මගේ අංකය : ඔඑම්/4/1/11 (එෆ්).

ලංකා විදේශ සේවයේ පහත සඳහන් මාරුවීම් දක්වා ඇති දිනයන්හි සිට ක්‍රියාත්මක විය :—

1970 ජූලි 4 වනදා සිට නැවත නියමයක් කරනතුරු ලංකා විදේශ සේවයේ III වන ශ්‍රේණියේ වයි. යෝගසුන්දරම් මහතා නිව්යෝර්ක් නුවර එක්සත් ජාතීන්ගේ ලංකා දූත මණ්ඩලයේ නියෝජ්‍ය නිත්‍ය නියෝජිත ලෙස.

1970 මැයි 20 වනදා සිට නැවත නියමයක් කරනතුරු ලංකා විදේශ සේවයේ IV වන ශ්‍රේණියේ වයි. දූරෙයිස්වාමි මහතා රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ සහකාර ලේකම් ලෙස.

1970 ජූලි 2 වනදා සිට නැවත නියමයක් කරනතුරු ලංකා විදේශ සේවයේ IV වන ශ්‍රේණියේ ඒ. පත්මරාජා මහතා ජිනීවා නුවර ලංකා කොන්සල් ජනරාල් හා එක්සත් ජාතීන්ගේ යුරෝපීය කාර්යාලයේ නිත්‍ය නියෝජිතයා ලෙස.

1970 මැයි 1 වනදා සිට නැවත නියමයක් කරනතුරු ලංකා විදේශ සේවයේ IV වන ශ්‍රේණියේ එන්. එම්. එම්. අයි. හුසේන් මහතා පිලිපීනයේ අතරතුරු නියෝජ්‍ය ලංකා තානාපති ලෙස.

1970 මැයි 5 වනදා සිට නැවත නියමයක් කරනතුරු, ලංකා විදේශ සේවයේ IV වන ශ්‍රේණියේ අයි. සෙන්ට්. ඊ. සිග්ලර් මහතා පැරිසියේ ලංකා තානාපති කාර්යාලයේ පළමුවන ලේකම් ලෙස.

1970 අප්‍රේල් 26 වැනිදා සිට නැවත නියමයක් කරනතුරු, ලංකා විදේශ සේවයේ IV වන ශ්‍රේණියේ ඊ්න්. බාලසුබ්‍රමානියම් මහතා පීකිං නුවර ලංකා තානාපති කාර්යාලයේ පළමුවන ලේකම් ලෙස.

1970 අප්‍රේල් 29 වනදා සිට නැවත නියමයක් කරනතුරු ලංකා විදේශ සේවයේ IV වන ශ්‍රේණියේ එම්. ආර්. පෙරේරා මහතා ඝානාවේ වැඩබලන ලංකා මහ කොමසාරිස් ලෙස.

1970 මැයි 12 වනදා සිට නැවත නියමයක් කරනතුරු ලංකා විදේශ සේවයේ IV වන ශ්‍රේණියේ පී. එම්. බී. ප්‍රනාන්දු මහතා බටහිර ජර්මනියේ ලංකා තානාපති කාර්යාලයේ පළමුවන ලේකම් ලෙස.

1970 මැයි 5 වනදා සිට නැවත නියමයක් කරනතුරු ලංකා විදේශ සේවයේ IV වන ශ්‍රේණියේ ඩී. ජී. බී. ද සිල්වා මහතා ටෝකියෝවේ ලංකා තානාපති කාර්යාලයේ පළමුවන ලේකම් ලෙස.

1970 ජූනි 3 වනදා සිට නැවත නියමයක් කරනතුරු ලංකා විදේශ සේවයේ IV වන ශ්‍රේණියේ සී. මහේන්ද්‍රන් මහතා රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ සහකාර ලේකම් ලෙස.

1970 මැයි 15 වනදා සිට නැවත නියමයක් කරනතුරු ලංකා විදේශ සේවයේ IV වන ශ්‍රේණියේ එස් ගෞතමදාස මහතා බ්‍රිතාන්‍යයේ ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ පළමුවන ලේකම් ලෙස.

1970 අප්‍රේල් 28 වනදා සිට නැවත නියමයක් කරනතුරු ලංකා විදේශ සේවයේ IV වන ශ්‍රේණියේ සී. ඊ. එන්. රුද්‍රිගු මහතා කැන්බරාහි ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ තුන්වන ලේකම් ලෙස.

1970 මැයි 3 වනදා සිට නැවත නියමයක් කරනතුරු ලංකා විදේශ සේවයේ V වන ශ්‍රේණියේ ඊ. එම්. කේ. බී. ඒකනායක මහතා තායිලන්තයේ ලංකා තානාපති කාර්යාලයේ තුන්වන ලේකම් ලෙස.

1970 මැයි 2 වනදා සිට නැවත නියමයක් කරනතුරු ලංකා විදේශ සේවයේ V වන ශ්‍රේණියේ ඩබ්ලිව්. පී. අබේසිංහ මහතා නව දිල්ලියේ ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ තුන්වන ලේකම් ලෙස.

ඒ. ආර්. රත්නවේල්,
සථිර ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය.

1970 අගෝස්තු මස 5 වන දින,
කොළඹ 1,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

8-658

# ආණ්ඩුවේ නිවේදන

## ගැසට් නිවේදනය

අංකය: පීආර්/ඒඑප්/98.

තම තනතුරෙන් ඉල්ලා අස්වූ ආර්. ඒ. ජී. මැක්මිචන් මහතා වෙනුවට පින්ලන්තය වෙනුවෙන් කොළඹ සිටින නිර්වේතනික කොන්සල් වශයෙන් ජේ. බී. හික්ස් මහතා 1970 ජූලි මස 1 වෙනි දින සිට විදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිනිය සතුටින් පිළිගන්නා ලදී.

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 අගෝස්තු මස 10 දින,
කොළඹ 1, සෙනේට් මන්දිරයෙහි,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ දීය.

8-566

---

එල්.ඕ.බී 7/63.

## 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 16අ වැනි වගන්තිය යටතේ දැන්වීම

1969 අංක 6 දරන පනතින් සංශෝධිත 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 16අ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් ඇමති, නානායක්කාර පතිරගේ මාටින් පෙරේරා වන මම "කොලොන්නාව තරුණ බෞද්ධ සංගමය" එකී වගන්තියේ කාර්යයන් සඳහා පිළිගත් පුණ්‍යායතනයක් යයි මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

ඇන්. ඇම්. පෙරේරා,
මුදල් ඇමති.

1970 අගෝස්තු 10 වෙනි දින,
කොළඹ දීය.

8-668

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡෙදය යටතේ සහතිකය

නිවාස හා ගොඩනැගිලි ඇමති, පීටර් ජෙරාල්ඩ් බර්තොලමියුස් කේනමන් වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 ඡෙදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ, මෙහි පහත සඳහන් උපබෙල්නයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡෙදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි:

පී. ජී. බී. කේනමන්,
නිවාස හා ගොඩනැගිලි ඇමති.

1970 ජූලි මස 31 දින,
කොළඹ දී ය.

### උපලේඛනය

උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ යාපනය කොට්ඨාශයේ වන්නාර් පොන්නිය පත්තුවේ බස්නාහිර වන්නාර් පොන්නෙයි පිහිටි ටී. කන්දයියා මිනින්දෝරු නැන විසින් පිළියෙල කරන ලද අංක 3023 හා 1966.10.21 දිනැති මාන්ක සැලැස්මේ ප්‍රකාර ලාච්ම් 1 කුලී 09½ ක ප්‍රමාණයෙන් යුත් පහත සඳහන් පරිදි මායිම් ඇති "පරයඩි" නමැති ඉඩම :—

උතුරට : පී. ඩබ්ලිව්. ඩී. පාර ;
නැගෙනහිරට : වහාබ්ගේ භායම්මාවු වන එසීමාට අයත් දේපල ;
දකුණට : සුල්තාන් මොහිදීන් නාච්යාට අයත් දේපල ;
බස්නාහිරට : මීරා මොහිදීන්ගේ භාර්යාව වන සයිපුල්ට අයත් දේපල.

8-557

---

ඇල්.ඩී—බී. 80/44.

## පඩි පාලක සභා ආඥපනත

### නිවේදනයයි

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥපනතේ 30 වන වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මීට යාව ඇති උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට, රබර් පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව අදහස් කරන බව එකී පඩිපාලක සභා ආඥපනතේ 28 වෙනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ යෝජනාවට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරුද්ධතා වණී 1970 සැප්තැම්බර් මස 4 වන දින දවල් 12 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරන සෑම විරුද්ධතාවයක්ම එසේ විරුද්ධවීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද සහිත ලියවිල්ලකින් විය යුතුය.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
රබර් පිටරට යැවීමේ කර්මාන්තය
පිළිබඳ පඩිපාලක සභාවේ සභාපති.

1970 අගෝස්තු මස 10 වැනි දින,
කොළඹ දීය.

### උපලේඛනය

රබර් පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1945 ජූලි මස 21 වැනි දින අංක 9,436 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූද, 1967 ඔක්තෝබර් මස 29 වැනි දින අංක 14,772/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් අවසාන වරට වෙනස් කරන ලද්දාවූද තීරණ, එම උපලේඛනයෙහි II වන කොටසෙහි "ආණ්ඩුවේ නිවාඩු දවස්" යන ශීර්ෂය යටතේ ඇති (අ) ඡෙදය වෙනුවට පහත දැක්වෙන අභිනව ඡෙදය ආදේශ කිරීමෙන්, තවදුරටත් වෙනස් කළ යුතුය :—

"ආණ්ඩුවේ නිවාඩු දවස්

1. (අ) (1) මේ ඡෙදයේ සහ 2 වන ඡෙදයේ විධිවිධානවලට යටත්ව, සෑම සේවා යෝජකයකුම විසින් තමා යටතේ සේවයෙහි යොදවා සිටින්නා වූ සියලුම කම්කරුවන්ට 1965 අංක 17 දරන නිවාඩු පනත යටතේ පහත සඳහන් ආණ්ඩුවේ නිවාඩු දවස් පඩි සහිත නිවාඩු දින වශයෙන් දිය යුතුය :—

(1) ජාතික වීරවරයින්ගේ දිනය (ජනවාරි 1) ;
(2) දෙමළ තෛපොන්ගල් දිනය ;
(3) නිදහස් අනුස්මරණ දිනය (පෙබරවාරි 4) ;
(4) සිංහල සහ දෙමළ අළුත් අවුරුදු දිනට පෙරාතුව වූ දිනය ;
(5) සිංහල සහ දෙමළ අළුත් අවුරුදු දිනය ;
(6) මැයි දිනය (මැයි 1) ;
(7) වෙසක් මස පුර පසළොස්වක් පොහෝ දිනයට ඉක්බිතිව එළඹෙන දිනය ;
(8) මිලාඩ්-උන්-නබි (මොහමඩ් නබිනායක තුමාණන් වහන්සේ උපන් දිනය) ;
(9) නත්තල් දිනය."

8-673

---

## සමගි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමඟ කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම, නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ පිහිටි තිස්පනේ නම් ප්‍රදේශයේ සමගිදායකයින්ගේ සභාවේ සභාපතිව සිටි එම ධුරයෙන් ඉල්ලා අස්වූ, වටද්දර පදිංචි උක්කු බණ්ඩා දිසානායක මහතා වෙනුවට, ගම්පොල, වටද්දර පදිංචි පන්ඩිතරත්න ශ්‍රී ලියන ආරච්චි මහතා, එකී සභාවේ සාමාජික ධුරය දරණ කාලය තුළ දී, එම සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

කොළඹ; අධිකරණ අමාත්‍යාංශයේ දීය.
1970 අගෝස්තු මස 7 වැනි දින,

8-554/1

---

## සමගි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47(2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමඟ කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම පුත්තලම දිස්ත්‍රික්කය තුළ පිහිටි කාක්ක පල්ලිය ගම් ප්‍රදේශයේ සමගිදායකයින්ගේ සභාවේ සභාපතිව සිට

ඉල්ලා අස්වූ කාක්කපල්ලිය, දෙමටපිටිය පදිංචි මදුරාවලගේ දොන් ජෝශප් පැන්ටලියන් පෙරේරා මහතා වෙනුවට මාදම්පේ, කරුක්කුව පදිංචි හෙන්ද්‍රික් සිංඤෝ ගුණරත්න මහතා එකී සභාවේ සාමාජික ධුරය දරණ කාලය තුළදී එම සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 අගෝස්තු මස 6 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

8-554/2

---

## සමගි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47(2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමඟ කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 (7) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මූල්ලිපොතාන ගම් ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරනු ලැබූ සමගිදායක සභාවේ පහත සඳහන් සාමාජිකයින් නිලයෙන් ඉවත් කරමි.

(1) ගන්තලාව, සාලයපුර, ගන්තලාව විහාරවාසී ඒ. සීලානන්ද ස්ථවිරයන් වහන්සේ.

(2) තම්පලකාමම්, ගල්මැටියාව පදිංචි එච්. ඩී. දේවයා මහතා.

(3) ගල්මැටියාව, පදිංචි බී. ඒ. වරසිංහ මහතා.

(4) ගන්තලාව, ගල්මැටියාව පදිංචි යූ. ජී. සෝමපාල මහතා.

(5) ගන්තලාව, පරවිපන්චන් පදිංචි ආර්. එම්. ගුණතිලක මහතා.

(6) තම්පලකාමම්, බටහිර කොලනියේ පදිංචි එම්. අලි අක්බාර් මහතා.

(7) තම්පලකාමම්, බටහිර කොලනියේ අංක 17 දරණ ඒකකයේ පදිංචි ඩබ්ලිව්. එම්. රම්බණ්ඩා මහතා.

(8) මූල්ලිපොතාන, අංක 334 දරණ ස්ථානයේ පදිංචි ඒ. පී. කේ. මස්තාන් මහතා.

(9) මූල්ලිපොතාන, 96 වැනි සැතපුම් කණුව ස්ථානයේ පදිංචි එල්. එච්. ආරියරත්න මහතා.

(10) කයන්වඩි අංක 374 දරණ ස්ථානයේ පදිංචි එස්. එම්. මොහමඩ් සුල්තාන් හජ්ජියාර් මහතා.

(11) මූල්ලිපොතාන, අංක 182 දරණ ස්ථානයේ පදිංචි එම්. ඩී. යසපාල මහතා.

(12) මූල්ලිපොතාන, අංක 823 දරණ ස්ථානයේ පදිංචි කේ. නාගරත්නම් මහතා.

(13) මූල්ලිපොතාන, අංක 1116 දරණ ස්ථානයේ පදිංචි මාරිමුත්තු කාලියප්පු මහතා.

(14) මූල්ලිපොතාන, අංක 1060 දරණ ස්ථානයේ පදිංචි කේ. සිත්‍රවේලු මහතා.

(15) ගන්තලාව, අංක 10 දරණ ඒකකයේ අංක 1145 හි පදිංචි අබ්දුල් වහබ් අබ්දුල් කුදූස් මහතා.

(16) ගන්තලාව, අංක 10 දරණ ඒකකයේ අංක 1031 හි පදිංචි ඇම්. අබ්දුල් අසීස් මහතා.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 අගෝස්තු මස 7 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

8-554/3

---

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව

### අංක 128—හපුතලේ මැතිවරණ කොට්ඨාශය

### නිවැරදි කිරීම

1968 නොවැම්බර් මස 30 වැනි දින අංක 14,829/8 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 10(3) වැනි වගන්තිය යටතේ අංක 128 හපුතලේ මැතිවරණ කොට්ඨාශය සම්බන්ධයෙන් වූ දැන්වීම් පහත සඳහන් පරිදි නිවැරදි විය යුතුය.

"පී" අක්ෂරය දරන ඡන්ද කොට්ඨාශයේ "පද්මා වත්ත" ට අනතුරුව "නායබැද්ද වත්තේ සෙන්ට් කැතරින් කොටස යන වතු වලින් යුක්ත වූ අංක 155 නිකපොත වසමට අයත් නිකපොත ගම් සභාවේ අංක 4 දරන කොට්ඨාශයෙන් කොටසක්" සහ "මසිලගස් තැන්න වත්තෙන් යුක්තවූ අංක 155 නිකපොත වසමට අයත් කොස්ලන්ද ගම් සභාවේ අංක 2 දරණ කොට්ඨාශයෙන් කොටසක්" යන්න ඇතුලත් විය යුතුය.

එස්. එම්. ජිෆ්රි,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරි,
අංක 128 හපුතලේ මැතිවරණ කොට්ඨාශය.

1970 ජූලි මස 29 වැනි දින,
බදුල්ල, කච්චේරියේ මැතිවරණ කාර්යාලයේ දීය.

8-575

---

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව

### පාර්ලිමේන්තු මහා මැතිවරණ, 1970

### අංක 7—කටාන මැතිවරණ කොට්ඨාශය වෙනුවෙන් නියෝජිතයකු තෝරා පත් කිරීම

ඉහත කී මැතිවරණයේ මන්ත්‍රීධුරාපේක්ෂකයකු වූ කේ. සී. ද සිල්වා මහතාගේ මැතිවරණ වියදම් පිළිබඳවූ වාර්තාව සහ එම වාර්තාවට සම්බන්ධ වූ ප්‍රකාශයන් ද, 1970 ජූලි මස 31 වෙනි දින මාවෙත ලැබුණ බවත්, මෙම දැන්වීම ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ වූ දා සිට ඉදිරියට ඇති හය මාසය තුල දී, රුපියල් එකක ගාස්තුවක් ගෙවීමෙන්, එකී වාර්තාව හා ප්‍රකාශයන් ද කායඝීල වේලාවන් තුළ ඕනෑම විටක දී, කොළඹ කච්චේරියේ මැතිවරණ කායඝීලයේ දී පරීක්ෂා කළ හැකි බැව්, 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 71(1) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඇස්. ඇන්. රාජා,
සහකාර තේරීම් භාර නිලධාරි,
අංක 7—කටාන මැතිවරණ කොට්ඨාශය.

මැතිවරණ කායඝීලය,
කච්චේරිය, කොළඹ,
1970 අගෝස්තු 5 වැනි දින.

8-553/1

---

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව

### පාර්ලිමේන්තු මහා මැතිවරණ, 1970

### අංක 7—කටාන මැතිවරණ කොට්ඨාශය වෙනුවෙන් නියෝජිතයකු තෝරා පත් කිරීම

ඉහත කී මැතිවරණයේ මන්ත්‍රීධුරාපේක්ෂකයකු වූ පී. ඩබ්ලිව්. එච්. මැන්ඩිස් මහතා ගේ මැතිවරණ වියදම් පිළිබඳවූ වාර්තාව සහ එම වාර්තාවට සම්බන්ධ වූ ප්‍රකාශයන් ද, 1970 අගෝස්තු මස 4 වෙනි දින මාවෙත ලැබුණ බවත්, මෙම දැන්වීම ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ වූ දා සිට ඉදිරියට ඇති හය මාසය තුල දී, රුපියල් එකක ගාස්තුවක් ගෙවීමෙන්, එකී වාර්තාව හා ප්‍රකාශයන් ද කායඝීල වේලාවන් තුළ ඕනෑම විටක දී, කොළඹ කච්චේරියේ මැතිවරණ කායඝීලයේ දී, පරීක්ෂා කළ හැකි බැව්, 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 71 (1) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඇස්. ඇන්. රාජා,
සහකාර තේරීම් භාර නිලධාරි,
අංක 7—කටාන මැතිවරණ කොට්ඨාශය.

මැතිවරණ කායඝීලය,
කච්චේරිය, කොළඹ,
1970 අගෝස්තු 5 වැනි දින.

8-553/2

---

## වරද නිවරද කිරීම

### කාර්මික ආරවුල් පනත 131 වන අධිකාරිය

මගේ අංකය : පී. 23/පී. 241/69.

ඇස්. අදිකාරම් මහතා සහ සීමාසහිත පහත හේවාහැට සමුපකාර වෙළඳ සමිති සහ විධසේවා සමුපකාර සමිති සංගමය අතර පවතින කාර්මික ආරවුල යොමුකිරීම සම්බන්ධ, කාර්මික ආරවුල් පනතෙහි (131 වන අධිකාරය) 4(1) වගන්තිය යටතේ ගරු කම්කරු ඇමතිතුමාගේ 1970 ජූලි මස 9 වන දින දරන නියෝගයට අමුණා 1970 ජූලි 17 වන දින හා අංක 14,915 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි 541 වන පිටුවෙහි පළකර තිබූ කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයෙහි කම්කරු කොමසාරිස්වරයාගේ නම "ඩබ්. පී. එල්. ද මෙල්" යනුවෙන් පළවී ඇති අතර, එය "ඩබ්. එල්. පී. ද මැල්" යනුවෙන් කියවෙන සේ නිවැරදි විය යුතුය.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

1970 අගෝස්තු මස 12 වැනි දින,
කොළඹ 5,
කම්කරු දෙපාර්තමේන්තුවේ දීය.

8-701

(626 පිටුව හා සම්බන්ධයි)

# විවිධ දෙපාර්තමේන්තු දන්වීම්

## විවාහ සිදුකිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡෙදය) 10 වැනි වගන්තියේ විධිවිධාන අනුව රොබට් සමරසේකර නමැති, ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම, ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැණෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දනුම් දෙනු ලැබේ.

| අංකය | ලියාපදිංචි කිරීමේ දිනය | විස්තරය | පිහිටීම | දේවගැතිතැන, අයිතිකරු හෝ භාරකරු | ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන්ද |
|---|---|---|---|---|---|
| 982 ... | ජූලි 9, 1970 ... | හෝලි රොසරි දේවස්ථානය ... | කොට්ටු කච්චිය ... | ගරු හෙන්රි ගුණවර්ධන... | රෝමානු කතෝලික |

රොබට් සමරසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ කාර්‍යාලය,
කොළඹ, 1970 ජූලි මස 9 වැනි දින.

8–568/1

---

## විවාහ සිදුකිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡෙදය) 10 වැනි වගන්තියේ විධිවිධාන අනුව රොබට් සමරසේකර නමැති, ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම, ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැණෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දනුම් දෙනු ලැබේ.

| අංකය | ලියාපදිංචි කිරීමේ දිනය | විස්තරය | පිහිටීම | දේවගැතිතැන, අයිතිකරු හෝ භාරකරු | ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන්ද |
|---|---|---|---|---|---|
| 980 ... | ජූනි 16, 1970 ... | සාන්ත සැබැස්ටියන් දේවස්ථානය ... | මුදුලක්කුලිය, ආනමඩුව... | ගරු හෙන්රි ගුණවර්ධන... | රෝමානු කතෝලික |

රොබට් සමරසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ කාර්‍යාලය,
කොළඹ, 1970 ජූනි මස 16 වැනි දින.

8–568/2

---

## කොළඹ දිස්ත්‍රික්කයේ 1969-70 වර්ෂයේ ගවයින් හණ නිවරණ කිරීමේ වැඩ සටහණ

1962 නොවැම්බර් මස 29 වන දින අංක 13,406 (සිංහල භාෂාවෙන්) දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද ගවයින් හණ නිවරණය කිරීම පිළිබඳ නීති මාලාවේ 12 (iii) වගන්තිය අනුව කොළඹ දිස්ත්‍රික්කයේ හාපිටිගම් කෝරළයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ 1969–70 ගවයින් හණ නිවරණය කිරීමේ වැඩ සටහන් මහජනයාගේ දනගැනීම පිණිස මෙහි පහත ප්‍රසිද්ධ කරනු ලැබේ.

ඩ. වි. ද අල්විස්,
කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපති.

1970 අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දිසාපති කාර්යාලයේ දී ය.

| කොට්ඨාශ අංකය හා නම | හංවඩු ගැසීමේ ස්ථානය | දිනය |
|---|---|---|
| 1–2—ගොඩකලාන ... | ''අළුත්වත්ත'' ලෝලුවාගොඩ ... | 70.8.17 |
| | '' ග්‍රාම සංවර්ධන සමිති ශාලාව අසළ '' ... | 70.8.18 |
| 3—දෙල්වල ... | '' මාවතහේන '' දෙල්වල ... | 70.8.17 |
| | '' කොස්වත්ත '' නාල්ල ... | 70.8.18 |
| | '' පරණවත්ත '' නාල්ල ... | 70.8.19 |
| 4—මාලදෙනිය ... | '' කහටගහවත්ත '' ඇලපිලියාව ... | 70.8.17 |
| 5-6-7—හේනේගම ... | '' කෝන්ගහමුල් වත්ත '' මිණිඹළුව ... | 70.8.17 |
| | '' පින්නගොල්ල වත්ත '' කණ්ඩලම ... | 70.8.18 |
| | '' මහවත්ත '' හකුරුකුඹුර ... | 70.8.19 |
| 8—මුගුරුගම්පල ... | '' කැලියගහවත්ත '' මුරුගම්පල ... | 70.8.18 |
| | '' පන්සල්වත්ත '' මුරුගම්පල ... | 70.8.19 |
| 9—පුරාණ මීරිගම ... | '' බෝමළුව වත්ත '' පුරාණ මීරිගම ... | 70.8.19 |
| | '' ගොඩැල්ල වත්ත '' ඉහළ මීරිගම ... | 70.8.20 |
| 10—වල්බෝතලේ ... | '' කහටගහවත්ත '' ... | 70.8.19 |
| 11—මදුරුපිටිය ... | '' අරලියගහ වත්ක '' හපුගහගෙදර ... | 70.8.18 |
| | '' ලෙව්වැවත්ත '' කඩිගමුව ... | 70.8.19 |
| 12—කීනදෙනිය ... | '' නවනැලිය වත්ත '' බජ්ජන්ගොඩ ... | 70.8.20 |
| | '' කොස්වත්ත '' තෙන්නාගම ... | 70.8.21 |
| 13—මාකුර ... | '' ගාලෙවත්ත '' තලගම ... | 70.8.21 |
| | '' කුකුල්වත්ත '' බලකව ... | 70.8.22 |
| 14—බෝතලේ පහළගම ... | '' බෝගහඕවිට '' බෝතලේ පහලගම ... | 70.8.21 |
| 14ඒ—බෝතලේ ඉහළගම ... | ග්‍රා.සේ. කාර්යාල වත්ත '' ... | 70.8.21 |
| 15—තවලම්පිටිය ... | '' කැකුණගහඕවිට '' තවලම්පිටිය ... | 70.8.21 |
| | '' පහල කොටුව '' විල්වත්ත ... | 70.8.22 |
| 15ඒ—නැලිගම ... | ග්‍රා. සේ. කාර්යාල වත්ත ... | 70.8.22 |

| කොට්ඨාශ අංක හා නම | හංවඩු ගැසීමේ ස්ථානය | දිනය |
|---|---|---|
| 16—ලින්දර | ග්‍රා. සේ. කාර්යාල වත්ත, ගළගම | 70.8.22 |
| 17—පොහොන්නරුව | " වෙල්මඩුව ඉඩම " පොහොන්නරුව | 70.8.22 |
| 18—පල්මඩ | ග්‍රා.සේ. කාර්යාල වත්ත, පල්මඩ | 70.8.24 |
| | ගමගෙවත්ත, හන්දුරුමුල්ල | 70.8.25 |
| 19—හේනේපොල | " අලවත්තැන්න " හීදියවල | 70.8.24 |
| | " කහටගහ වත්ත " හේනේපොල | 70.8.25 |
| 20—වේවැල්දෙනිය ඉහළගම | " කම්බිකොටුව " වේවැල්දෙනිය හංදිය | 70.8.25 |
| 20ඒ—වේවැල්දෙනිය පහළගම | " පල්ලෙලන්ද " වේවැල්දෙනිය, පහළගම | 70.8.25 |
| 21/22—මඩබාවිට | " මෙනේරිවත්ත " දන්ඔවිට | 70.8.26 |
| | " පන්සල්වත්ත " මඩබාවිට | 70.8.27 |
| | " මහපිටියවත්ත " අරුක්ගොඩ | 70.8.28 |
| 23—කොටදෙනිය | " මාවතකුඹුර " කොටදෙනිය | 70.8.29 |
| | " ඇඹිල්ල ඕවිට " වේරගොඩ | 70.8.30 |
| 24—මුරුතවල | " ඇනිකට් වත්ත " මුරුතවල | 70.8.24 |
| 25—හාපිටිගම | " ගල්පොලලියද්ද වත්ත" හාපිටිගම | 70.8.24 |
| 26/27—කල්එලිය පල්ලෙවෙල | " මිරිස්වත්ත " කල්එලිය, පල්ලෙවෙල | 70.8.25 |
| | " පේෂකර්ම මධ්‍යස්ථානය අසළ " උඩවෙල | 70.8.26 |
| 28—මල්ලැහැව | " කුරුඳුවත්ත " මල්ලැහැව | 70.8.26 |
| 28ඒ—වැල්ල විලමුල්ල | " දෙවටගහවත්ත " වැල්ලවිලමුල්ල | 70.8.26 |
| 29/30—මිදෙල්ලවල | " ගිරිතල ලන්ද " වල්බෝලාන | 70.8.26 |
| | " දෙනියකැලේ " පල්ලෙවෙල | 70.8.27 |
| | " හපුගහවත්ත " වේරගොඩ | 70.8.28 |
| 31—බොකලගම-අම්බලන්වත්ත | " නැකතිගෙ වත්ත " අම්බලන්වත්ත | 70.8.28 |
| | ග්‍රාම සේවක කාර්යාල වත්ත | 70.8.29 |
| 31ඒ—බොකලගම ඉහළ | " ග්‍රාමසේවක කාර්යාල වත්ත " | 70.8.28 |
| | " නාගහවත්ත " පැලපිටිගම | 70.8.29 |
| 32—කුකුල්නාපෙ | " කෝන්ගහ වත්ත " කුකුල්නාපෙ | 70.8.29 |
| | " විවිධ සේවා සමූපකාර ඉඩම " ගල්ගාන | 70.8.30 |
| 33—හංවාපොල | " ඉලුක්ගොල්ල වත්ත " හංවාපොල | 70.8.28 |
| | " දෙල්ගහවත්ත " දැත්ගම | 70.8.29 |
| 34—මුද්දරගම | " දෙල්ගහවත්ත " රජය සතු ඉඩම | 70.8.30 |
| 35—කැප්පිටිවලාන | " සමූපකාර සමිති ශාලා ඉඩම " | 70.8.30 |
| | " කැටකාලගහවත්ත " බාඳුරාගොඩ | 70.9.1 |
| 36—ගස්පෙ | " හපුගහවත්ත " ගස්පෙ පහළගම | 70.8.30 |
| 37/38—උඩුඋල්ල | " කඩේවත්ත " උඩුඋල්ල | 70.8.30 |
| 39—කොස්ඇටදෙනිය | ග්‍රාමසේවක කාර්යාල ඉඩම | 70.9.1 |
| 40—ඉදිපරපේ | " කහටගහවත්ත " අම්බන | 70.9.1 |
| | " නාපෙකැලේ " කොටකන්ද ඉඩම, ඉදිපරපේ | 70.9.2 |
| 41—පරණ හල්පෙ | " දෙවටබඩවත්ත " පරණ හල්පෙ | 70.9.1 |
| 42—හල්පෙ | පරණ වත්ත නොහොත් මීගහමුල්ලවත්ත | 70.9.2 |
| 43—කිතුල්වල | ග්‍රා. සේ. කාර්යාල වත්ත | 70.9.2 |
| 44—වත්තෙමුල්ල | " දෙල්ගහලන්ද " කළුඅග්ගල, පහළගම | 70.9.2 |
| | " බෝගහවත්ත " වත්තෙමුල්ල | 70.9.3 |
| 45—කුලීගෙදර | " සියඹලගහමුල වත්ත " | 70.9.3 |
| 46—මඩිතියවල | " මඩිතියවල වත්ත " මඩිතියවල | 70.9.3 |
| | " රජය සතු ඉඩම " කළුඅග්ගල, ඉහළගම | 70.9.4 |
| 47/48—හභවත්ත | " වටියායකැලේ වත්ත " රස්සපාන | 70.9.3 |
| 49—උල්ලපොල | " බෝගහලන්ද " | 70.9.4 |
| | " සියඹලාගහවත්ත " | 70.9.5 |
| 50—බලගල්ල | " ග්‍රා. සං. සමිති ශාලා ඉඩම " | 70.9.4 |
| 51—කුඩගම්මන | " වතුයාය නිලමෙ මහතාගේ පොල්මැස්ස අසළ " | 70.9.4 |
| | " මහහේන වත්ත " කුඩගම්මන | 70.9.5 |
| 52—හෙට්ටිමුල්ල | " ග්‍රා. සං. සමිති ශාලා වත්ත " හෙට්ටිමුල්ල | 70.9.4 |
| | " එදිරිසූරිය මහතාගේ වත්ත " කැලෑගෙදර | 70.9.5 |
| | " පෙතන්ගහ වත්ත " පොත්තෙගෙදර | 70.9.6 |
| | " කහටගහ වත්ත " නාවාන | 70.9.6 |
| 53ඒ—පරගොඩ | " වෙලබඩ වත්ත " පරගොඩ | 70.9.6 |
| | " ඕබඩලන්ද " දියගම්පල | 70.9.7 |
| 54—එරබද්ද | " බර්වින්ටන් වත්ත " කොටදෙනියාව | 70.9.6 |
| | " යකඩවල වත්ත " | 70.9.7 |
| 54ඒ—පොල්වත්ත | " පෙරවල කටුව වත්ත " පොල්වත්ත | 70.9.9 |
| | " පරණ වත්ත " මානින්ගමුව | 70.9.10 |

## කොළඹ දිස්ත්‍රික්කයේ 1969-70 වර්ෂයේ ගවයන් හණ නිවරණ කිරීමේ වැඩ සටහන

1962 නොවැම්බර් මස 29 වන දින අංක 13,406 (සිංහල භාෂාවෙන්) දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද ගවයින් හණ නිවරණය කිරීම පිළිබඳ නීති මාලාවේ 12 (III) වගන්තිය අනුව කොළඹ දිස්ත්‍රික්කයේ, බටහිර හේවාගම් කෝරළයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය තුළ 1969–70 ගවයින් හණ නිවරණය කිරීමේ වැඩ සටහන මහජනයාගේ දැනගැනීම පිණිස මෙහි පහත ප්‍රසිද්ධ කරනු ලැබේ.

ඩ. වී. ද අල්විස්,
කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපති.

1970 ජූලි මස 11 වැනි දින,
කොළඹ දිසාපති කාර්යාලයේ දී ය.

| ග්‍රා. සේ. අංකය හා කොට්ඨාශය | හැවඩු ගැසීමේ ස්ථානය | දිනය |
|---|---|---|
| 469/70—නවගමුව/රණාල | වල්පිටගොඩ පිහිටි දෙල්ගහවත්ත | 70.9.1 |
| | රණාල පිහිටි දෙල්ගහවත්ත | 70.9.2 |
| | උඳුගොඩ පිහිටි ගුරුන්නාන්සෙලාගේ වත්ත | 70.9.3 |
| 476—මාලාබේ ... | ග්‍රා. සේ. කාර්යාලය අසල ගල්පොත්තේ වත්ත | 70.9.1, 2, 3 |
| 480—දැඩිගමුව ... | රක්මලගේ වත්ත ... | 70.9.1, 2, 3 |
| 484—පිට්පන උතුර | උතුරු පිට්පන අලුබෝගහ වත්ත | 70.9.1, 2, 3 |
| 471—බෝමිරිය ඉහළ | ග්‍රා. සේ. කාර්යාල භූමිය | 70.9.4, 5, 6 |
| 477—තලංගම උතුර | ග්‍රා. සේ. කාර්යාල භූමිය | 70.9.4, 5, 6 |
| 481—හබරකඩ/මුල්ලේගම | ග්‍රා. සේ. කාර්යාල භූමිය | 70.9.4, 5, 6 |
| 484ඒ—පිට්පන දකුණ | ගලගාහේන නමැති ඉඩම | 70.9.4, 5 |
| | ග්‍රා. සේ. කාර්යාල භූමිය | 70.9.6 |
| 472—බෝමිරිය පහළ | ග්‍රාම සේවක කාර්යාල භූමිය | 70.9.7, 9, 10 |
| 478—තලාහේන | තලාහේනේ පිහිටි දෙල්ගහවත්ත | 70.9.7, 9, 10 |
| 482—පනාගොඩ | ග්‍රාම සේවක කාර්යාල භූමිය | 70.9.7, 9, 10 |
| 485—මාවත්ගම | ග්‍රාම සේවක කාර්යාල භූමිය | 70.9.7, 9 |
| | උඩුවන විවිධ සේවා සමූපකාරය අසල | 70.9.10 |
| 473—කොතලාවල | කොතලාවල පිහිටි කැටකැලගහ වත්ත | 70.9.11, 12, 13 |
| 479—තලංගම දකුණ | ග්‍රාම සේවක කාර්යාල භූමිය | 70.9.11, 12 |
| 483—ගොඩගම | ග්‍රාම සේවක කාර්යාලය අසළ | 70.9.11, 12, 13 |
| 486—හෝමාගම | ග්‍රා. සේ. කාර්යාලය අසල අලුබෝගහවත්ත | 70.9.11, 12, 13 |
| 474—හේවාගම ... | කැකිරිදෙනියේ පිහිටි දෙල්ගහලන්ද ... | 70.9.14, 16 |
| | ග්‍රාම සේවක කාර්යාලය පිහිටි වත්ත | 70.9.17 |
| 491—කලපලුවාව | ග්‍රාමසේවක කාර්යාල භූමිය | 70.9.14, 16, 17 |
| 498—මාලපල්ල | මාකුඹුර ගල්මෝල වත්ත | 70.9.14, 16, 17 |
| 500—බ්‍රාහ්මනගම-මාඹුල්ගොඩ | ග්‍රාම සේවක කාර්යාලය පිහිටි ඉඩම ... | 70.9.14, 16, 17 |
| 475—වැලිවිට ... | වැලිවිට වාත්තු කම්මල අසල | 70.9.18 |
| | වැලිවිට ග්‍රාම සේවක කාර්යාලය අසල | 70.9.19 |
| | වැලිවිට විවිධ සේවා සමූපකාරය අසල | 70.9.20 |
| 492—බත්තරමුල්ල | ග්‍රාම සේවක කාර්යාලය පිහිටි ඉඩම ... | 70.9.18, 19, 20 |
| 496ඒ—කොට්ටාව උතුර | ග්‍රාම සේවක කාර්යාලය පිහිටි ඉඩම ... | 70.9.18, 19, 20 |
| 499—හිරිපිටිය-නියදගල | ග්‍රාම සේවක කාර්යාලය පිහිටි ඉඩම ... | 70.9.18, 19 |
| | නියදගල මකුළුගහලන්ද | 70.9.20 |
| 501—මුල්ලේරියාව උතුර | ග්‍රාම සේවක කාර්යාලය පිහිටි ඉඩම ... | 70.9.21, 23, 24 |
| 493—කලල්ගොඩ-තලවතුගොඩ ... | කලල්ගොඩ පිහිටි කොස්ගහලන්ද ... | 70.9.21, 23, 24 |
| 496—කොට්ටාව දකුණ | කොට්ටාව දකුණ ගොඩපරගහවත්ත | 70.9.21, 23, 24 |
| 495—හෝකන්දර දකුණ | ග්‍රාම සේවක කාර්යාලය පිහිටි දෙල්ගහවත්ත | 70.9.21, 23, 24 |
| 502—මුල්ලේරියාව උඩුමුල්ල | උඩුමුල්ලේ පිහිටි අහන්දිය පොකුණවත්ත | 70.9.25, 27, 28 |
| 494—හෝකන්දර උතුර | හෝකන්දර උතුර දාඹුගහවත්ත | 70.9.25, 27, 28 |
| 497—රුක්මලේ | රුක්මලේ හන්දිය අසල ගොඩපරගහවත්ත | 70.9.25, 27, 28 |
| 490—අතුරුගිරිය | ග්‍රාම සේවක කාර්යාලය අසල පිහිටි ඉඩම | 70.9.25, 27, 28 |
| 503—මුල්ලේරියාව-හිඹුටාන | මුල්ලේරියාව ග්‍රා. සේ. කාර්යාලය පිහිටි ඉඩම | 70.9.30, 70.10.1, 2 |
| 487/88—කොරතොට-ඔරුවල | වනපොකු මූකලාන නමැති ඉඩම | 70.9.30, 70.10.1, 2 |
| 489—පෝරේ ... | ගල්කැටිය පිංළිඳ අසල ඇති ගල්කැටිය වත්ත | 70.9.30, 70.10.1 |
| | වල්ගම ඇල්. ඩී. වික්‍රමතිලක මහතාට සහ තවත් අයට අයත් අටඅමුණකන්දහේන | 70.10.2 |

8–580

---

## රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

වාර්ෂික තොග හරිවැරදි බැලීම සහ ගිණුම් පියවීම සඳහා 1970 සැප්තැම්බර් 23 වැනි දින සිට 1970 ඔක්තෝබර් මස 6 වෙනි දින දක්වා (දෙදිනම ඇතුලත්ව) රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් භාණ්ඩ නිකුත් කිරීම නවත්වනවා ඇත.

2. දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ බඩු ඉල්ලුම් කරන නිලධාරීන් වෙත දැනටමත් මගේ අංක ඒප්/ඒසිසිපීඑස්/සී/එල් හා 1970 ජූලි 30 වෙනි දින දරණ ලිපියෙන් දන්වා යවා ඇති පරිදි අංක 962/7/138 (සී.පී.ඇස්/බී) 218 හා 1949. 7. 1 වෙනි දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛනයේ විස්තර කෙරෙන පහත සඳහන් හදිසි අවශ්‍යතාවයන් සඳහා නොවේ නම්, 1970 අගෝස්තු 15 වෙනිදායින් පසු බඩු ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

1. අළුත්වැඩියා කිරීම ප්‍රමාද නොකළ හැකි යන්ත්‍ර සූත්‍ර ආදිය සඳහා.
2. ගංවතුර සඳහා අවශ්‍ය භාණ්ඩ සඳහා.
3. වසංගත රෝග සම්බන්ධයෙන් අවශ්‍ය භාණ්ඩ සඳහා.

එස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1970. 8. 12,
කොළඹ 2.

8-709

## වන්දනා ආඥාපනත

**වෙරුගල් සිතිර වේලායුදස්වාමි දේවාලයේ උත්සවය 1970—ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

යථෝක්ත උත්සවය 1970. 9. 2 වැනි දින සිට 1970. 9. 20 දින දක්වා පැවැත්වෙන බව ඊට සහභාගි වන වන්දනාකරුවන් සහ අනෙකුත් අයගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම උත්සවය පවත්නා කාලසීමාව තුළ බල පැවැත්වෙන 1946 අගෝස්තු මස 2 වැනි දින අංක 9,508 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද ස්ථාවර රෙගුලාසි කෙරෙහි වන්දනාකරුවන්ගේ සහ අනෙකුත් අයගේ අවධානය මෙයින් යොමු කරවනු ලැබේ.

ඩබ්ලිව්. එල්. ප්‍රනාන්දු,
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දිසාපති.

1970 අගෝස්තු මස 11 වන දින,
ත්‍රිකුණාමලය දිසාපති කාර්යාලයේ දීය.

8-664

---

## 1952 ආහාර පාලන අණපනත් යටතේ දැන්වීමයි

1952 ආහාර පාලන අණපනත්වල III වැනි කොටසේ (ඊ) අක්ෂරය දරණ ශීර්ෂය යටතේ 4 (3) දරණ ඡේදය අනුව මහජනයා වෙත මෙයින් දන්වා සිටිනුයේ 25 වෙනි වාරයේ සහල් සලාක පොත් 1970 අගෝස්තු මස 24 වෙනි සඳුදා සිට වලංගු වන බවයි. 25 වෙනි වාරයේ සලාක පොත්වල අංක 1 දරණ කූපනය 1970 අගෝස්තු මස 24 වැනිදාසිත් පටන් ගන්නා සතිය තුළදී ද, අංක 2 දරණ කූපනය 1970 අගෝස්තු මස 31 වැනිදාසිත් පටන් ගන්නා සතිය තුළදී ද, යන ක්‍රමයට කූපන් වලංගු වනවා ඇත.

ඩී. පී. වී. ඒ. ජේ. පී. සේනාරත්න,
ආහාර පාලක.

1970 අගෝස්තු මස 12 දින,
කොළඹ 2.

8-657

---

## ලංකා කම්කරු අමාත්‍යාංශය

### ප්‍රථමාධාර පත්‍රිකාව

**සිරීම් සහ සුළු තුවාල :**

සෑම සිරීමක්ම සහ සුළු තුවාලයක්ම සඳහා වහාම ප්‍රතිකාර කරන්න. වැඩි වැඩියෙන් ප්‍රමාද වන තරමට තුවාලයට විෂබීජ ඇතුළු වීමේ ඉඩද වැඩිවේ.

පිරිසිදු රෙදි කඩකින් ඉවත් කළ හැකි හෝ පිස දැමිය හැකි පෙනෙන්නට තිබෙන ආගන්තුක ද්‍රව්‍ය ඉවත් කරන්න.

තුවාලය නොසෝදන්න. අවශ්‍ය නම් තුවාලය අවට කොටස් සබන්වලින් හෝ වෙන යම්කිසි යෝග්‍ය ද්‍රව්‍යයකින් පිරිසිදු කරන්න.

තුවාල වී ඇති මතුපිටට ප්ලේවින් ආලේප කරන්න.

විෂබීජ නසන ලද, සෑහෙන ප්‍රමාණයක පටියකින් තුවාල බඳින්න.

අවශ්‍ය වේ නම් මේ පටියට උඩින් කපු පුළුන් තබා ඇලෙන සුළු ප්ලාස්ටරයකින් තවදුරටත් බැඳීම හෝ බැන්ඩේජ් පටියකින් බැඳීම කළහැකිය.

**ලේ ගලන තුවාල :**

ඇටයක් කැඩී ඇති බවට සැකයක් නොමැති නම් ලේ ගලන තුවාලය ඇති කොටස ඔසවන්න.

අඩු තරමින්ම අවශ්‍ය වස්ත්‍ර පමණක් ඉවත් කොට තුවාලය අනාවරණය කරගන්න.

පිරිසිදු රෙදි කඩකින් ඉවත් කළහැකි හෝ පිස දැමිය හැකි පෙනෙන්නට තිබෙන ආගන්තුක ද්‍රව්‍ය ඉවත් කරන්න.

කැටි ගැසී තිබිය හැකි ලේ ඇතොත් ඉවත් නොකරන්න.

තුවාලය අවට සම පිරිසිදු කරන්න.

විෂබීජ නසනලද, සෑහෙන ප්‍රමාණයක තුවාල පටියකින් ඔතන්න.

කපු පුළුන් හෝ තුවාල පටි තදින් තබා ඇලෙන සුළු ප්ලාස්ටර් හෝ බැන්ඩේජ් යොදා තුවාලය ඇති පෙදෙස තද වන ලෙස බඳින්න.

තුවාලයක් පැසවන්නේ එයට විෂබීජ ඇතුල්වීමෙනි. එමනිසා, විෂබීජ නසනලද තුවාල පටියක් නිතරම පාවිච්චි කළයුතුය. බෙහෙත් කැවූ සාමාන්‍ය ලින්ට් ඇල්ලීමෙන් පසුව විෂබීජවලින් තොරව නොපවතී.

අත් කිසි විටක විෂබීජවලින් තොර නොවන නිසා, කිසිවිටක තුවාලය හෝ තුවාලයට යොදන තුවාල පටියේ කොටස අතින් නො ඇල්ලිය යුතුය.

අවශ්‍ය අවස්ථාවන් හිදී, හැකි ඉක්මනින් වෛද්‍ය ප්‍රතිකාර ලබාගත යුතුය.

සියළුම වශීවල තුවාලවලදී, පිටගැස්මෙන් වැලකීම සඳහා ප්‍රතිකාර ලබාගත යුතුය.

**පිළිස්සුම් හෝ දියරයන්ගෙන් වූ දැවීම් :**

පිළිස්සීමෙන් හෝ දැවීමෙන් වූ තුවාලය විෂබීජ නසන ලද පිළිස්සුම් බඳින යෝග්‍ය ප්‍රමාණයක තුවාල පටියකින් ආවරණය කරන්න.

තෙල් සාමාන්‍යයෙන් විෂබීජවලින් තොර නොවන හෙයින්, පසුව කරන වෛද්‍ය ප්‍රතිකාරවලට බාධාවන නිසා පිළිස්සුනු තුවාලයකට තෙල් පාවිච්චි නොකළ යුතුය.

කිසිම බිබිලක් හිල් නොකරන්න.

**අම්ල සහ ක්ෂාරමය පිළිස්සීම් :**

**අම්ල.**—පිළිස්සුණු තුවාලයට ඇල් වතුර මනාසේ ගල්වන්න. එසේ කිරීමෙන් අනතුරුව එයට සෝඩා බයිකාබනේට් කුඩු (බේකිං සෝඩා) හෝ කාබනේට් සෝඩා කුඩු (රෙදි සෝදන සෝඩා) ඉසින්න.

**ක්ෂාර.**—පිළිස්සුනු තුවාලය හුණුවලින් සිදුවී ඇති එකක් නම්, එම තුවාලයෙන් පෙනෙන්නට තිබෙන හුණු සියල්ලම ඉවත් කරන්න.

තුවාලයට මනාසේ ඇල්වතුර ගල්වන්න.

දෙහි යුෂ හෝ විනාකිරි වැනි සැර අඩු අම්ල මිශ්‍රණයකට සමාන ප්‍රමාණයක් වතුර දමා එම මිශ්‍රණයෙන් තුවාලය හොඳින් තෙමන්න.

ඇසිඩ්වලින් සිදුවූ හෝ ක්ෂාරවලින් සිදුවූ පිළිස්සීම් තුවාලයක් වුවද එය විෂබීජ නසනලද තුවාල පටියකින් බඳින්න.

**ඇස අපවිත්‍රවීම සහ ඇසේ ආගන්තුක ද්‍රව්‍ය පතිතවීම :**

**අපවිත්‍රවීම.**—ගලායන වතුරෙන් ඇස් විනාඩි 15ක් සෝදන්න.*

**ආගන්තුක ද්‍රව්‍ය.**—ගලායන වතුරෙන් ඇස විනාඩි 15ක් සෝදන්න.

සෝදා හරින්නට නොහැකි කිසිම සියුම් කැබෙල්ලක් ඉවත් කිරීමට උත්සාහ නොකරන්න. එවැනි අවස්ථාවකදී කෙලින්ම වෛද්‍ය ප්‍රතිකාර ලබාගත යුතුයි.

ඇසෙහි ඇතිවන සෑම තුවාලයකටම වෛද්‍ය ප්‍රතිකාර ලබාගත යුතුයි.

* සැලකිය යුතුයි.—මේ සඳහා උඩු අතට හැරවූ, වතුර විදින නලයක් හෝ ඇස් සෝදන වතුර මලක් නිර්දේශ කෙරේ.

**කැඩුම් බිඳුම්—සාමාන්‍ය නීති :**

අනතුර සිදුවූ තැනදීම තුවාලයට ප්‍රථමාධාර දීම අරඹන්න. වෙන යම්කිසි හේතුවකින් ජීවිතයට අනතුරක් පැමිණෙන්නට ඇතොත් මිස බිඳුන කොටස නොසෙලවෙන්නට සලස්වන තුරු තුවාලකරු එහා මෙහා නොකරන්න.

බිඳුන කොටස් වෙලුම් පටි යොදා ශරීරයට තද කොට බැඳීමෙන් ඒවායේ කෙලවර සෙලවීමෙන් වලකාලන්න. බිඳුනු කොටස් මතුපිටත් ඉතා තදිනුත් වෙලුම් පටි නොයොදන්න.

තුවාලවූ කොටස කෙටීමෙන් සහ සෙලවීමෙන් වැලැක්වීමට ආධාරකයක් යොදන්න.

**විදුලි බලයෙන් සිදුවන තුවාල :**

1. විදුලි ප්‍රවාහය නවතා දමන්න.
2. විදුලි ප්‍රවාහය නවතා දැමීමට හෝ විදුලි ප්‍රවාහය කඩා දැමීමට නොහැකි නම් තුවාලකරු එය හා ගැටීමෙන් ඉවත් කරන්න. අතිශයින්ම ප්‍රවේසම්කාරී විය යුතුය. රබර් අත්වැසුම්, ඝන කම් කබායක් හෝ වෙන යම්කිසි ඇඳුමක් වැනි විදුලිය නොවදින වියලි ආරක්ෂක ද්‍රව්‍යයකින් මේ විපතින් මුදවන්නට යන තැනැත්තාගේ අත් සහ ශරීරය ආරක්ෂා විය යුතුය. හැකි නම්, ඔහු රබර් අඩි සහිත "බූට්ස්" හෝ සාමාන්‍ය සපත්තු පැළඳ හෝ වියලි පුවක්පත් ගොඩක් මත නැගී සිටිය යුතුය.

**අවවාදයයි.**—ඉතා බලගතු වෝල්ට් ප්‍රමාණයන්හි විදුලිය චාපවීම, එනම්, වාතය අතරින් හෝ ආරක්ෂක ද්‍රව්‍යය අතරින් පොලොවට විදුලිය කාවැදීමේ අන්ත්‍රාවට ඉඩ තිබේ. මෙවැනි අවස්ථාවන්හිදී, විදුලි බලය නවතා දැමිය යුතුය. නැතහොත් පුහුණු පුද්ගලයන්ට මේ උපද්‍රවයෙන් බේරා ගැනීමේ කටයුතු භාර කළයුතුය.

3. ඕනෑම පහසු ක්‍රමයකින් කෘත්‍රිම ශ්වසනය ලබාදෙන්න. අනතුරට භාජනය වූ අය ආශ්වාස ප්‍රශ්වාස නොකරන්නේ නම්, සෑම තත්පරයක්ම වටිනා හෙයින් කාලය අපතේ නොහැරිය යුතුය.

**මුවට මුව තැබීමේ ක්‍රමය :**

තුවාලකරු උඩුකුරුව තබන්න. ඔහුගේ හිස දැතින්ම අල්වාගෙන එක් අතක් ඔහුගේ නලලේ තබා හිස පසුපසට තෙරපන්න. අනික් අතින් යටි හක්ක උඩට සහ පහළට තල්ලුකරන්න.

ඔබගේ තොල් තුවාලකරුගේ තොල්වලට තබා තද කරන්න.

සිනිඳු ලේන්සුවක් අතරට තැබීම මැනවි. අනතුරට භාජනය වූ අයගේ නාස්පුඩුවලින් වාතය නොයන සේ ඔබගේ ඇඟිලි වලින් ඒවා මිරිකන්න.

ඔහුගේ පෙනහැලිවලට හුස්ම පිඹ, ඔහුගේ පපුව ඉස්සෙන සැටි බලන්න. ඒ එක් එක් වරකට ඔබගේ මුව ඉවත් කරගන්න. හුස්ම පිඹීම විනාඩියකට 10 වරක් බැගින් වියයුතුයි. ප්‍රථම හුස්ම පිඹීමේ වාර 6 හැකි ඉක්මනින් කළ යුතුය.

4. වෛද්‍යාධාර සොයන්න. වෛද්‍යාධාර සොයන අතර කෘත්‍රිම ස්වසනය දිගටම කරගෙන යායුතුය.

**හුස්ම හිරවීම :**

හුස්ම හිරවීමට තුඩු දුන් හේතුවෙන්, අනතුරට භාජනය වූ තැනැත්තා හෝ හැකිනම් හේතුව ඉවත් කරන්න.

බේරන්නට යන තැනැත්තා තමාගේම හුස්ම හිරවීම වැළැක්වීමට මනාසේ ආරක්ෂා විය යුතුය.

කෘත්‍රිම ස්වසනය භාවිතා කරන්න.

වෛද්‍ය ප්‍රතිකාර සොයන්න.

8-562

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

කංකානම් ගමගේ දොන් ඩේවිඩ් පතිරත්න නියෝජ්‍ය වරාය කොමසාරිස් (පාලන) තනතුර දරන කල්හි, 1950 අංක 10 දරන කොළඹ වරාය (පාලන) පනතේ 18 (2) ඡේදය සමග කියැවෙන, 15(2) වැනි ඡේදය යටතේ ප්‍රතිපාදිත පරිදි නඩු පැවරීම් අනුමත කිරීමට අරුමදුර නන්දසේන සිල්වා කුලසිංහ වන මම මින් බලය පවරමි.

අ. න. සි. කුලසිංහ,
වරාය කොමසාරිස්.

තැ. පෙ. 528,
කොළඹ 1,
1970 අගෝස්තු මස 10 දින.

8-603

---

## කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

කොළඹ 10, අංක 180, ඩීන්ස් පාරේ පිහිටි කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ "නූල් වෙළඳ ගබඩාව" බඩු ගණන් ගැනීම සඳහා 1970 සැප්තැම්බර් මස 11 දින සිට ඔක්තෝබර් මස 17 දක්වා දෙදිනම ඇතුළුව වසා තබනු ලැබේ.

ඇස්. ගුණධීර,
අධ්‍යක්ෂ,
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව.

කොළඹ 1,
1970 අගෝස්තු මස 12 වැනි දින.

8-679

## 1961 අංක 13 දරණ වගාරක්ෂණ පනත

### 11(2) දරණ වගන්තිය යටතේ කරන නිවේදනයයි

මෙහි පහත දක්වා ඇති හේතු වලින් කුමක් හෝ කරණකොට ගෙන නියමිත ප්‍රදේශයන්හි ඇති වී වගාවට සිදුවන අලාභ හානි 1961 අංක 13 දරණ වගාරක්ෂණ පනත යටතේ සම්පාදනය වී ඇති පරිදි අනිවාර්‍ය්‍ය ලෙස රක්ෂණ විය යුතු බැව් සියළු දෙනාගේම දැන ගැනීම පිණිස මෙයින් නිවේදනය කරමි.

හේතූන් :—

(1) ජලය අඩුවීම
(2) නියඟය
(3) ජලය වැඩිවීම
(4) ගංවතුර ගැලීම
(5) ගොයම් රෝග
(6) කෘමි වසංගත
(7) වල් ඌරන්
(8) වල් අලින්
(9) අනුමත ගොවිතැන් ක්‍රම

එස්. බී. සේනානායක,
ගොවිජන සේවා කොමසාරිස්.

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
අංක 4, බුලර්ස් පටුමග,
කොළඹ 7,
1970 ජූලි මස 28 දින.

8-684/1

---

## 1961 අංක 13 දරණ වගාරක්ෂණ පනත

### 13 (3) (අ) දරන වගන්තිය යටතේ කරන නිවේදනයයි

1961 අංක 13 දරණ වගාරක්ෂණ පනතේ 13(3)(අ) දරණ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව ගොවිජන සේවා කොමසාරිස් වන සෙනෙවිරත්න බණ්ඩා සේනානායක වන මම, රක්ෂිත වූ බිම් ප්‍රමාණයන්හි ඉතාම අඩු වශයෙන් පිළිපැදිය යුතු ගොවිතැන් ක්‍රම හා සම්මත කරන ලද විශේෂ ගොවිතැන් ක්‍රම මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි අන්දමට විය යුතු බව මෙයින් නියම කරමි.

එස්. බී. සේනානායක,
ගොවිජන සේවා කොමසාරිස්.

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
අංක 4, බුලර්ස් පටුමග,
කොළඹ 7,
1970 ජූලි මස 28 දින.

### උපලේඛනය

අඩුම වශයෙන් අනුගමනය කළ යුතු ගොවිතැන් ක්‍රම—

(1) නියරවල් සහ වේලි අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම.
(2) බිම් කෙටීම හෝ/සහ හෑම හෝ/සහ මඩ කිරීම හෝ/සහ මට්ටම් කිරීම.
(3) ඊ වැපිරීම.
(4) වගාව ගැන සැළකිලිමත්වීම හා එය ආරක්ෂා කිරීම.
(5) වගාවට සිදුවෙන හානිය වැළැක්වීමට හෝ අඩු කිරීමට පිළියම් යෙදීම.
(6) අස්වැන්න කපා ගැනීම.

විශේෂ ගොවිතැන් ක්‍රම—

(1) පෙළට වී ඉසීම හෝ පැල සිටවීම හෝ පෙළට පැල සිටවීම.
(2) අනුමත කරන ලද පෝර වර්ග යෙදීම.
(3) වල් නෙලීම සහ/හෝ වල් පැළෑටි නාශක බෙහෙත් විදීම හෝ පැල හෑම.

8-684/2

---

# ආණ්ඩුවේ නිවේදන

(621 පිටුව හා සම්බන්ධයි)

මගේ අංකය : සී/අයි. 1056.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපණත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4(2) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය කම්කරු කොමසාරිස්වරයාගේ අනුබද්ධිත ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව,

කොළඹ 2, යූනියන් පෙදෙසේ අංක 123,
එක්සත් ඉංජිනේරු කම්කරු සමිතිය,

සහ

කොළඹ 2, වොක්ස්හෝල් වීදිය, අඹවත්ත මිල්ස්,
ද ඇක්මි ඇලුමිනියම් කොම්පැනි ලිමිටඩ්

අතර කාර්මික ආරවුලක් පවතී.

කම්කරු ඇමති, මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14, අංක 62, 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(2) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල නිරවුල් කිරීම සඳහා එම පනතේ 22 වන වගන්තිය යටතේ සංස්ථාපනය කරනු ලබන්නාවූ කාර්මික අධිකරණයක් වෙත යොමු කරමි.

ඇම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 අගෝස්තු මස 20 වැනි දින,
කොළඹ දීය.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

**131 වන අධිකාරිය, කාර්මික ආරාවුල් පනත**

එක්සත්-ඉංජිනේරු කම්කරු සමිතිය,
123, යූනියන් පෙදෙස,
කොළඹ 2.

සහ

ද ඇක්මි ඇලුමිනියම් කොම්පැණි ලිමිටඩ්.
අඹවත්ත මිල්ස්, වොක්ස්හෝල් වීදිය,
කොළඹ 2.

අතර පවතින කාර්මික ආරාවුලක් පිළිබඳවයි.

**ආරාවුලට හේතුව් පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය**

ඉහත දැක්වෙන පාර්ශ්වයන් අතර ආරාවුලට හේතුවී ඇති කරුණු නම් :

(1) 1970. 5. 31 න් අවසන්වන කාර්තුවේදී මධ්‍යම ප්‍රමාණයේ ඇලුමිනියම් කොළ නිෂ්පාදනය වර්ග අඩි කෝටි දෙකහමාර කට අඩු අතර, නිෂ්පාදන ප්‍රසාද දීමනා සඳහා එය වර්ග අඩි කෝටි දෙකහමාරක් වශයෙන් ගණන්ගත යුතුය.

(2) පැමිණීම අනුව පෝය දින වේතන ගෙවීම.

(3) වාර්ෂිකව විනෝද ගමනක් සැලැසීම.

(4) උදුන් ක්‍රියාකරවන්නන්ට දිනකට රු. 2 බැගින් විශේෂ දීමනාවක් ගෙවීම.

(5) ආපනශාලාවට මේස සහ පුටු සැපයීම, සහ

(6) ධෝවන දීමනාව වැඩිකිරීම ද වේ.

1970 අගෝස්තු මස 18 වැනිදා වූ මෙදින, කොළඹ කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඩබ්. ඇල්. පී. ද මෙල්,
කම්කරු කොමසාරිස්.

8-911

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුයි.

### උපලේඛනය

**1970**

| මාසය | | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| ජූනි | ... | 70. 6. 5 සිකුරාද | ... | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 6.11 බ්‍රහස්පතින්ද | ... | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 6.18 බ්‍රහස්පතින්ද | ... | 70. 6.11 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | | 70. 6.25 බ්‍රහස්පතින්ද | ... | 70. 6.18 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| ජූලි | ... | 70. 7. 2 බ්‍රහස්පතින්ද | ... | 70. 6.25 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | | 70. 7.10 සිකුරාද | ... | 70. 7. 2 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | | 70. 7.17 සිකුරාද | ... | 70. 7.10 සිකුරාද | දහවල් | 12.0 |
| | | 70. 7.24 සිකුරාද | ... | 70. 7.17 සිකුරාද | දහවල් | 12.0 |
| | | 70. 7.31 සිකුරාද | ... | 70. 7.24 සිකුරාද | දහවල් | 12.0 |
| අගෝස්තු | ... | 70. 8. 7 සිකුරාද | ... | 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70. 8.14 සිකුරාද | ... | 70. 8. 7 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 8.21 සිකුරාද | ... | 70. 8.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 8.28 සිකුරාද | ... | 70. 8.21 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | ... | 70. 9. 4 සිකුරාද | ... | 70. 8.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 9.11 සිකුරාද | ... | 70. 9. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 9.18 සිකුරාද | ... | 70. 9.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 9.25 සිකුරාද | ... | 70. 9.18 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | ... | 70.10. 2 සිකුරාද | ... | 70. 9.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70.10. 9 සිකුරාද | ... | 70.10. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70.10.16 සිකුරාද | ... | 70.10. 9 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70.10.23 සිකුරාද | ... | 70.10.16 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70.10.30 සිකුරාද | ... | 70.10.23 සිකුරාද | ප.ව. | 3.30 |
| නොවැම්බර් | ... | 70.11. 5 බ්‍රහස්පතින්ද | ... | 70.10.30 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70.11.12 බ්‍රහස්පතින්ද | ... | 70.11. 5 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | | 70.11.20 සිකුරාද | ... | 70.11.12 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | | 70.11.27 සිකුරාද | ... | 70.11.20 සිකුරාද | දහවල් | 12.0 |
| දෙසැම්බර් | ... | 70.12. 4 සිකුරාද | ... | 70.11.27 සිකුරාද | දහවල් | 12.0 |
| | | 70.12.11 සිකුරාද | ... | 70.12. 4 සිකුරාද | දහවල් | 12.0 |
| | | 70.12.18 සිකුරාද | ... | 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70.12.24 බ්‍රහස්පතින්ද | ... | 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70.12.31 බ්‍රහස්පතින්ද | ... | 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති

1970 මාර්තු 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.